## 424 ස්ප්‍රීතු සාන්තු දෙව් වඩිනු

ස්ප්‍රීතු සාන්තු දෙව් වඩිනු
ගැතුන් මනස් හි වසනු
වරම් තුෂාර වස්වනු
ඔබෙන් දිනි සිත් වඩනු

ඉඳුරන් අප දල්වලා
සිත දාවෙන් දල්වලා
දුබල කය මුළුල්ලා
වීරියෙන් නිති පුරලා

සතුරන් අප පලවා
සාම සිතෙහි පිහිටුවා
නියම් පා වැටුම් පාදවා
පාපයෙන් අප ගලවා

තෙද වේවා දෙව් පියටා
මරණ දිනූ පුතුටා
අස්වසන්තා වූ ඔබටා
දැනුත් අනන්ත කාලෙටා